DOI : 10.31357/fhssmst.2008.00638

# අග්‍රාමාත්‍ය ඩී. එස්. සේනානායක මහතාගේ ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්ති පිළිබඳ ඇගැයීමක්

රාජ කොණ්ඩසිංහලාගේ මොනිකා ට්‍රිලීෂියා ඉන්ද්‍රාණි
GS/SS/1175/2001

ශාස්ත්‍රපති

2008

# අග්‍රාමාත්‍ය ඩී. එස්. සේනානායක මහතාගේ ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්ති පිළිබඳ ඇගැයීමක්

රාජ කොණ්ඩසිංහලාගේ මොනිකා ට්‍රිලීෂියා ඉන්ද්‍රාණි

**GS/SS/1175/2001**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා ඉතිහාස විෂය යටතේ ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය 2008.

# අපේක්ෂකයාගේ ප්‍රකාශය

''මෙම නිබන්ධයේ අන්තර්ගතය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්. සී. එන්. ධර්මරත්න ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත් මේ පර්යේෂණ වාර්තාව කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ අනික් ආයතනයකට හෝ වෙනත් උපාධියක්/ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.''

..............................................

පර්යේෂකයාගේ අත්සන

ආර්.කේ.මොනිකා ට්‍රිලීෂියා ඉන්ද්‍රානි

වර්ධනපුර වි...

19 MAR 2008

උපාධි අධ්‍යයන

## උපදේශකගේ ප්‍රකාශය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි/කරමු.

2009/03/03
.................................
දිනය

.......................................................................
උපදේශකගේ අත්සන

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, එස්. ඩී. එන්. ධර්මරත්න

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
19 MAR 2008
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පටුන | 1 - 2 |
| උපකාරානුස්මෘතිය | 3 - 4 |
| කෙටි යෙදුම් | 5 |
| හැඳින්වීම | 6 - 8 |

**පළමුවැනි පරිච්ඡේදය :**

| | |
|---|---|
| **සේනානායක පරපුරේ ආරම්භය සහ පසුබිම** | **1 - 53** |
| 1.1 මධ්‍යම පංතියේ ආරම්භය හා සේනානායක පරපුර | 1 - 16 |
| 1.2 අමද්‍යප ව්‍යාපාරයට ඩී. එස්. සේනානායකගෙන් ලද දායකත්වය | 17 - 31 |
| 1.3 සිංහල - මුස්ලිම් කෝලාහලය හා ඩී. එස්. සේනානායක | 32 - 44 |

**දෙවැනි පරිච්ඡේදය :**

| | |
|---|---|
| **නිදහස් සටන් ව්‍යාපාරය සහ නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා වශයෙන් ඩී. එස්. සේනානායක අනුගමනය කළ දේශීය හා විදේශීය ප්‍රතිපත්ති** | **54 - 96** |
| 2.1 නිදහස් සටන් ව්‍යාපාරයට ඩී. එස්. සේනානායකගෙන් ලද දායකත්වය | 54 - 74 |
| 2.2 නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා වශයෙන් ඩී. එස්. සේනානායක අනුගමනය කළ දේශීය සහ විදේශ ප්‍රතිපත්තිය | 75 - 90 |

**තෙවැනි පරිච්ඡේදය :**

| | |
|---|---|
| **ඩී. එස්. සේනානායකගේ පුරෝගාමීත්වයෙන් පිහිටුවන ලද ජනපද සහ ඩී. එස්. සේනානයකයන් අනුගමනය කළ වතුකම්කරු ප්‍රතිපත්තිය** | **97 - 146** |
| 3.1 බ්‍රිතාන්‍ය පාලනය අගභාගයේ ජනපද පිහිටුවීමේ ඓතිහාසික පසුබිම | 97 - 105 |
| 3.2 ඩී. එස්. සේනානායකගේ මූලිකත්වයෙන් උතුරු, උතුරුමැද සහ උතුරු-නැගෙනහිර පළාත්වල ජනපද පිහිටුවීමේ කටයුතු | 106 - 124 |
| 3.3 වතු කම්කරු ප්‍රශ්නය සහ ඩී. එස්. සේනානායක | 125 - 139 |

**සිව්වැනි පරිච්ඡේදය :**

**ඩී. එස්. සේනානායක අනුගමනය කළ ඉඩම්, කෘෂිකාර්මික සහ වාරිමාර්ග ප්‍රතිපත්තිය** **147 - 185**

4.1 බ්‍රිතාන්‍ය යුගයේ මෙරට ඉඩම් ප්‍රතිපත්තියේ ස්වභාවය 147 - 157

4.2 ඩී. එස්. සේනානායකගේ පුරෝගාමීත්වයෙන් සිදු වූ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු 158 - 166

4.3 ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික හා වාරිමාර්ග ක්ෂේත්‍රයට ඩී. එස්. සේනානායකගෙන් ලද දායකත්වය 167 - 180

**පස්වැනි පරිච්ඡේදය :**

**සමාලෝචනය** **186 - 188**

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** **189 - 205**

**උපග්‍රන්ථ** **i-xvi**

# උපකාරානුස්මෘතිය

පර්යේෂණ මාතෘකාව අනුමත කර දෙමින් මා පර්යේෂණය සඳහා යොමු කළ මහාචාර්ය එස්. බී. හෙට්ටිආරච්චි මහතා සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නන්දනී දමයන්ති කරුණාතිලක මහත්මියටත් මාගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමි.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්. ඩී. එන්. ධර්මරත්න මහතා යටතේ අධ්‍යාපනය ලැබීමට ලද අවස්ථාව ද මා සලකන්නේ දුර්ලභ ගණයේ භාග්‍යයක් ලෙසය. මාගේ පර්යේෂණ උපදේශක වශයෙන් එතුමා, කාර්ය බහුලත්වය හමුවේ මා හට ලබාදුන් මඟ පෙන්වීම හා දිරිමත් කිරීම පර්යේෂණය ඉදිරියට කරගෙන යාමට දිරියක් වූ බව ගෞරවයෙන් යුතු ව සිහිපත් කරමි.

මාගේ පර්යේෂණ කටයුතු කිරීමේ දුෂ්කරතා පැවසීමේ දී, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ වර්තමාන අංශාධිපතිතුමා වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී. බී. මණ්ඩාවල මහතා, තම අත්දැකීම් විස්තර කරමින් මා හට ලබාදුන් වටිනා උපදේශයන් මාගේ පර්යේෂණ කටයුතු ඉදිරියට කරගෙන යාමට මහත් ශක්තියක් වූ බව ගෞරවයෙන් සිහිපත් කරමි.

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පත්මසිරි කන්නන්ගර මහතා ඇතුළු අනෙකුත් ආචාර්ය භවතුන් ලබාදුන් සහයෝගය පිළිබඳව ඔවුන්ට ද මාගේ ගෞරව ප්‍රණාමය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

මෙහි සෝදුපත් කියවා දුන් රවීන්ද්‍ර දෙමටදෙණිය මහතාට ද මාගේ කෘතඥතාව පිරිනමමි.

පර්යේෂණය සඳහා අවශ්‍ය ග්‍රන්ථ සොයා ගැනීමේ දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපතිතුමා සහ දයානන්ද පීරිස් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ජාතික කෞතුකාගාර, ජාතික ලේඛනාරක්ෂක, ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සංගමය, ජේ. ආර්. ජයවර්ධන කේන්ද්‍රය යන ස්ථානවල කාර්ය මණ්ඩලයෙන් හා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී

රුක්මන් සේනානායක මහතාගෙන් සහ බෝතලය වලව්ව භාර දූනට සිටින පිරිසගෙන් ද ලැබුණු සහයෝගය කෘතගුණ පූර්වකව සිහිපත් කළ යුතුය.

නිබන්ධය පරිගණක ගත කිරීමේ දී සාමා මහත්මියගෙන් ලද විශේෂ සහයෝගය කෘතවේදීත්වයෙන් සිරිපත් කරමි.

දුකේදීත් සැපේදීත් ලඟ සිටිමින් නිරතුරුව ම මාව ධෛර්යමත් කළ ආදරණීය අශාන්ටත්, මා හට කරදර නොවී සිටි මාගේ කිරිකැටි දරු පැටියාටත්, මාගේ ආදරණීය අම්මාටත්, බඩට අහරක් පිස ගැනීමට අපහසු වුව ද, විටින් විට රෝගාතුර වුවද, තම නිවසින් ආදරණීය බිරිඳ (මාගේ මව) නිදහස් කර මාගේ පර්යේෂණයට උදව් දීමට මා නිවස වෙත අම්මා එවීමට තරම් කාරුණික හදවතක් තිබූ මාගේ ආදරණීය පියාණන්ටත්, පවුලේ සැමටත් මාගේ භක්තාදරය හා ප්‍රණාමය හිමි විය යුතුය.

## කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| C. H. J. | - | Ceylon Historical Journal. |
| C. J. H. S. S. | - | Ceylon Journal of Historical and Social Studies. |
| C. N. C. | - | Hand Book of the Ceylon National Congress. |
| J. R. A. S. C. B | - | Journal of Royal Asiatic Society of Ceylon Branch. |
| U. C. H. C. | - | University of Ceylon History of Ceylon. |
| U. C. R. | - | University of Ceylon Review. |
| S. L. N. A. | - | Sri Lanka National Archives. |

## හැඳින්වීම

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් ස්වෛරීභාවය නැවත ලබා ගැනීම සඳහා ගෙන ගිය නිදහස් සටන්වලට හා අරගලවලට නායකත්වය සැපයූවා වූ ද, දිවයිනේ දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයන් හැඩ ගැස්වීම සඳහා දායක වූ ද, නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී. එස්. සේනානායකයන්ගේ නායකත්වය, දායකත්වය හා ඔවුන්ගේ සුවිශේෂීත්වය කුමක් දැයි යන්න තීරණය කිරීමේ අරමුණින් මෙම පර්යේෂණය කිරීමට උත්සාහ ගෙන ඇත. වර්තමානය වන විට ඉතිහාස විද්‍යාවේ මූලධර්ම පදනම් කර ගනිමින් එතුමා පිළිබඳව කෘතීන් කිහිපයක් මෙන් ම කඩින් කඩ එළ වූ ශාස්ත්‍රීය ලිපි කිහිපයක් ද දක්නට ඇතත් මෙතුමා පිළිබඳ වූ විධිමත් පර්යේෂණයක් මෙතෙක් දක්නට නො ලැබේ. එබැවින් ඩී. එස්. සේනානායකයන් ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රයට කරන ලද කාර්යභාරය පිළිබඳ විධිමත් පර්යේෂයක නියැලීම සුවිශේෂීත්වයක් උසුලන බව පැහැදිලි වේ.

පළමු පරිච්ඡේදය යටතේ ශ්‍රී ලංකාවේ මධ්‍යම පංතිය තුළින් ධනේශ්වරය කරා ගමන් කළ පරපුරක් ලෙස සේනානායක පරපුර හැඳින්විය හැකිය. නින්දගම් හිමි පාරම්පරික ප්‍රභූ පරපුරක් ලෙස පැවත ඒත් සමකාලීන ආර්ථික පසුබිම යටතේ බ්‍රිතාන්‍ය වතු වගා ව්‍යාප්තිය හා සබැඳි අනෙකුත් කර්මාන්තයන් හි නියැලීමෙන් ධනය උපයා ගත් සේනානායක පරපුර පිළිබඳව මෙම පරිච්ඡේදයේ පළමු කොටස තුළින් අධ්‍යයනය කරනු ලැබේ. ජාතියට ම අවැඩදායක වූ අමද්‍යප ව්‍යාපාරයට සම්බන්ධවීමට ලැබීම එතුමාගේ දේශපාලන ජීවිතයේ ඉදිරියට යෑම ධෛර්යමත් කළේ ය. එනම් අමද්‍යප ව්‍යාපාරය තුළ ඩී. එස්. සේනානායකයන් ක්‍රියකාරී ආරම්භක සාමාජිකයකු ලෙස කටයුතු කළ ආකාරය, එතුමාගේ දායකත්වය කෙබඳු ද යන්න සවිස්තරාත්මක ව විවරණය කිරීම මෙම පරිච්ඡේදයේ දෙවන අරමුණ වේ. එසේ ම ක්‍රි. ව. 1915 දී සිංහල-මුස්ලිම් කෝලාහලය සමයේ දී ඩී. එස්. සේනානායකයන් ඇතුළු දේශීය නායකයන් තුළ පැවති අපේක්ෂාත්, ඔවුනොවුන ගේ ක්‍රියාකාරීත්වය හා එය ජාතික නිදහස් සටනට මඟ හෙළි කර දුන් සන්ධිස්ථානයක් ලෙසත් 1915 සිංහල-මුස්ලිම් කෝලාහලය පිළිබඳ විවරණය කිරීම පළමු පරිච්ඡේදයේ තෙවන අභිප්‍රාය වේ.

දෙවන පරිච්ඡේදය යටතේ ප්‍රථමයෙන් ම නිදහස් සටන් ව්‍යාපාරය ට ඩී. එස්. සේනානායකයන්ගෙන් ලද දායකත්වය කෙබඳුද යි විග්‍රහ කෙරේ. එනම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට දායක වෙමින් ද, ලංකා ජාතික සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙසින් ද, විශේෂයෙන් ක්‍රි. ව. 1924 සිට වඩ වඩාත් දේශපාලනයට සම්බන්ධ වෙමින් හා ක්‍රි. ව. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ සිට ක්‍රි. ව. 1948 නිදහස ලබා ගන්නා තෙක් ගමන් මාවත පිළිබඳ අධ්‍යයනය කෙරේ. මෙසේ බ්‍රිතාන්‍යයන් සමඟ සාකච්ඡා මාර්ගයෙන් ලංකාවට නිදහස ලබා ගැනීම සඳහා වූ උත්කෘෂ්ට කාර්යයට දායක වූ ආකාරය මෙහි දී අධ්‍යයනය කෙරේ.

මෙම පරිච්ඡේදය යටතේ දෙවනුව ඩී. එස්. සේනානායක ගේ විදේශ ප්‍රතිපත්තිය ඇගැයීමට ලක් කෙරේ. නිදහසින් පසු ප්‍රථම ආණ්ඩුවේ අගමැති ලෙස එතුමා ගත් ක්‍රියා මාර්ග විග්‍රහ කෙරේ. විදේශ සම්බන්ධතාවල දී එතුමා ගත් ක්‍රියාකාරී පියවර තුලනාත්මකව විමසීම මෙහිලා වැදගත් විය. විශේෂයෙන් ම බ්‍රිතාන්‍ය සමඟ ඇති කර ගත් ආරක්ෂක හා බාහිර ගිවිසුම් ඇතුළුව අනිකුත් රටවල් සමගත් එතුමා ගොඩනගා ගත් සම්බන්ධතා විග්‍රහ කෙරේ.

තෙවන පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකාවේ ජනපද පිළිබඳව සාකච්ඡාවට භාජනය කොට ඇත. ප්‍රථමයෙන් ම බ්‍රිතාන්‍ය පාලනය සමයේ ජනපද පිහිටුවීමේ ඓතිහාසික පසුබිම පිළිබඳ ව පැහැදිලි කිරීමක් සිදු කෙරේ. දෙවනුව ඩී. එස්. සේනානායකගේ පුරෝගාමීත්වයන් ආරම්භ කරන ලද ජනපද ව්‍යාපාරය පිළිබඳව පිරික්සා බැලේ. මෙහිදී විශේෂයෙන් උතුරු, උතුරු මැද හා උතුරු නැගෙනහිර ජනපද පිහිටුවීම පිළිබඳව අධ්‍යයනයට ලක් කෙරේ. මෙම පරිච්ඡේදයේ තෙවන කොටසේ දී ඩී. එස්. සේනානායකයන් ඉන්දිය වතු කම්කරුවන් පිළිබඳව අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය පිළිබඳව අධ්‍යයනයට ලක් කර තිබේ.

හතරවන පරිච්ඡේදය යටතේ ඩී. එස්. සේනානායකගේ ඉඩම්, කෘෂිකාර්මික හා වාරි මාර්ග ප්‍රතිපත්තිය පිළිබඳව හෙළිදරව් කිරීමට උත්සහ දරා ඇත. විශේෂයෙන් ලංකාවේ පැවති පැරණි ආර්ථික ක්‍රමය මූලික වශයෙන් ම වෙනස් වීමට පදනම වැටුනේ බ්‍රිතාන්‍යයනගේ වතු වැවිලි වගාව නිසා ය. එබැවින් වතු වැවිලි වගාව සඳහා දේශීය භූමිය යොදා ගත් ආකාරය විග්‍රහ කෙරේ. එහිදී බ්‍රිතාන්‍යයන් විසින් ඉඩම් අණ පනත් රාශියක් පනවමින් ඔවුන්ගේ අර්ථ

ක්‍රමය ස්ථාපිත කිරීමට අවශ්‍ය පසුබිම සකස් කරගත් ආකාරය පිළිබඳ විස්තර කෙරේ. එනම් බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉඩම් ප්‍රතිපත්තියේ ස්වාභාවය පිළිබඳව අධ්‍යයනය කෙරේ. දෙවනුව මෙම පරිච්ඡේදය යටතේ ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ ඉඩම් හා කෘෂිකර්මාන්ත අමාත්‍යවරයා ලෙස ඩී. එස්. සේනානායකයන් ඉඩම් නිරවුල් කරමින් ඉඩම් සම්බන්ධව ගන්නා ලද ප්‍රතිපත්තීන් පිළිබඳව පුළුල්ව සාකච්ඡා කෙරෙනු ඇත.

මෙම පරිච්ඡේදයේ තෙවන කොටසේ දී එතුමා විසින් ආරම්භ කරන ලද කෘෂිකාර්මික හා වාරිමාර්ග ප්‍රතිපත්තීන් පිළිබඳව අධ්‍යයනය කිරීමක් සිදු කර තිබේ. අවසාන පරිච්ඡේදය යටතේ සමස්ථයක් ලෙස ඩී. එස්. සේනානායකගේ ආර්ථික හා දේශපාලන ක්ෂෙත්‍රයෙහි ලා කරන ලද මේ සා විශාල කාර්යභාරය ඇගැයීමකට ලක් කරමින් සමාලෝචනයක් සිදු කර තිබේ.

මෙම නිබන්ධයේ දී උපයෝගී කර ගත් මූලාශ්‍ර අතර ඩී. එස්. සේනානායකගේ අත් පිටපත්, බ්‍රිතාන්‍ය පාලන සමයේ දී හුවමාරු කර ගත් අත් පිටපත් මූලික මූලාශ්‍ර ලෙසත්, ශාස්ත්‍රීය කෘතීන් හා සඟරා ලිපි ද්විතීය මූලාශ්‍ර ලෙසත් භාවිතා කළ අතර සේනානායක පරපුරේ වර්තමානයේ සිටින සාමාජිකයන් සමඟ සම්මුඛ සාකච්ඡා මගින් ලබා ගත් දත්තයන් ද උපයෝගී කර ගන්නා ලදී. මෙසේ මූලික හා ද්විතීය ලෙස එක්රැස් කර ගත් දත්ත හා තොරතුරු පෙළ ගැස්වීම හා විශ්ලේෂණය තුළින් මෙම නිබන්ධය සකස් කර ඇත.

## 1.1 මධ්‍යම පන්තියේ ආරම්භය සහ සේනානායක පරපුර

මධ්‍යම පන්තියේ බිහිවීම බොහෝදුරට සිදු වූයේ බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට මුල්බැස ගන්නා ලද වතු වගා ව්‍යාපාර හා බැඳී පැවති වාණිජ ආර්ථික රටාවේ ප්‍රතිඵලයක් වශයෙනි. බ්‍රිතාන්‍ය පාලනය යටතේ බිහි වූ නව ධනේශ්වර පංතියට පෙරාතුව ඉපැරණි සිරිත් විරිත් මත පදනම් වූ පරම්පරාගත ප්‍රභූ පැලැන්තියක් සිටි බව අනාවරණය වේ. පහත රට මුල් කොටගෙන බිහි වූ පාරම්පරික ප්‍රභූවරු අතර ඉලංගකෝන්, ද සරම් හා නවරත්න යන පරම්පරාවවල් එවකට පහතරට සමාජයේ කැපී පෙනෙන නායකයෝ වූහ.[1] දහනව වන ශත වර්ෂයේ මුල් භාගයේ විසූ ද සරම් මුදලි ගඟබඩපත්තුවේ හි සිටි පාරම්පරික සිංහල ප්‍රභූවරයෙකි. මාතර ආදායම් පාලක වූ තෝමස් ඊඩන් පෙන්වා දෙන අන්දමට යථෝක්ත මුදලිතුමා ජ්‍යොතිෂ ශාස්ත්‍රය, නීතිය, ගුප්ත විද්‍යා, ශිල්ප කලාව හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ පුළුල් දැනුම් සම්භාරයකින් යුතු ව සිටි අයෙකු බව පෙනේ.[2]

පූර්වෝක්ත පරම්පරාගත ව පැවත ආ ප්‍රභූවරුන්ට අමතරව එවකට පහතරට සමාජයේ තවත් ප්‍රභූ පැලැන්ති කීපයක් වැදගත් ස්ථාන අත් කරගෙන සිටි බව පෙනේ. ඒ අතර මාතර මැද කෝරළයේ තිලකරත්න පරපුර, මාතර සිංහල ප්‍රදේශයේ තෙන්නකෝන් පරපුර, දන්තුරෙන් පැමිණි ඒකනායක පරපුර හා කළුතොටින් පැමිණි අමරකෝන් පරපුර ප්‍රධානත්වයක් ගෙන තිබේ.[3] මෙම ප්‍රභූ පැලැන්තිවල විසූ ඇතැම් ප්‍රභූවරු එවකට විශාල වශයෙන් ආදායම් උපදවා ගන්නා ලද්දේ කෘෂිකාර්මික කටයුතුවලට සම්බන්ධ වීමෙනි. ඉලංගකෝන් පරපුරෙන් පැවත ආ දොන් සයිමන් ඉලංගකෝන් නම් ප්‍රභූවරයාට වී ගොවිතැන සම්බන්ධ ව පුළුල් දැනුමක් පැවති අතර එතුමා මෙරට ඕලන්ද පාලන සමයේ පත් ව ආ ආණ්ඩුකාරයා වූ හෙන්ද්‍රික් බේකර්තුමා (ක්‍රි.ව. 1707-1716) විසින් මාතර බත්ගම්හි වී ගොවිතැන පිළිබඳ නායක ධුරයට පත් කරන ලද බව සඳහන් ය.[4] එමෙන් ම මෙම පරම්පරාගත ප්‍රභූ තත්ත්වයට අයත් තවත් සමහර ප්‍රභූවරු ඕලන්ද පාලන සමය තුළ දී හා බ්‍රිතාන්‍ය පාලන සමාරම්භයේ දී රාජ්‍ය සේවයේ යෙදීමෙන් ද ධනය උපයා ගෙන තිබේ. ඕලන්ද පාලන සමයේදී දොන් සීමන් විජේසුන්දර නවරත්නයන් මුදලි පදවියක් දැරීය. බ්‍රිතාන්‍ය ආණ්ඩුව සමාරම්භයේ දී දොන් ඩේවිඩ් ජයතිලක අබේසිරිවර්ධන ඉලංගකෝන් මුදලිතුමා මාතර දිස්ත්‍රික්කයේ මහමුදලි

සමග කඩවත් සතරේ මුදලිධුරය ද භාෂා පරිවර්තක මුදලි ධුරය ද, ගජනායක මුදලි ධුරය ද දැරී ය.[5] ලන්දේසි පාලන සමයේදී ද මුදලි, මුහන්දිරම්, කෝරාළ යන තනතුරු පිරිනමා තිබේ.[6] මීට අමතරව අධිනීතිඥ, මහජන නොතාරිස්, විවාහ රෙජිස්ට්‍රාර්, ගම්මුලාදෑනී නැතහොත් විදාන ආරච්චි, ගම්බද උසාවිවල සභාපති, ගම්බද පෙදෙස්වල පාසැල් ගුරුවරු යන තනතුරු ද පිරිනමා ඇත.[7] මොවුන් මෙම වෘත්තීන්වල නියැලීමෙන් ධනය උපයා ගෙන ඇත.

පහතරට කේන්ද්‍ර කොටගෙන බිහි වූ මෙම පාරම්පරික ප්‍රභූ පැලැන්තිය එවකට ගොයිගම කුලයට පමණක් සීමා වී නො පැවතිණ. එ නම් පහතරට මුහුදුබඩ ප්‍රදේශවල විසූ සෙසු කුලයන් ද බොහෝ දුරට ආර්ථික බලයක් හිමි කර ගනිමින් සමාජතලයේ උච්චස්ථානයට පත් ව සිටි හෙයිනි. එම කුල අතර සලාගම, කරාව, දූරාව, නවම්දන්න හා රදා යන කුලයන් ප්‍රමුඛස්ථානයක් ගෙන තිබේ.[8] විශේෂයෙන් මෙම කුලයන් සිය ආර්ථික අභිවෘද්ධිය සලසා ගැනීමේ මූලික පියවර තබන ලද්දේ ලන්දේසි පාලන සමයේදී ය. ඒ අනුව ලන්දේසි පාලනය යටතේ සලාගම් කුලයේ පිරිස් කුරුඳු කර්මාන්තයේත්, කරාව කුලයේ පිරිස් වඩු කර්මාන්තයේත්, දූරාව කුලයේ පිරිස් ඇතුන් ඇල්ලීම පිළිබඳ කර්මාන්තයේත් යෙදීමෙන් විශාල වශයෙන් ධනය උපයා ගන්නා ලදී.[9] එපමණක් ද නොව පූර්වෝක්ත කුලයන් සඳහා ලන්දේසි පාලනය යටතේ මුදලි තනතුර ද පිරිනමා ඇති බව අනාවරණය වේ. නිදසුන් ලෙස දොන් ජෝන් ඉලංගකෝන් ගාල්ලේ මහමුදලි ධුරයට ද, දොන් සයිමන් තෙන්නකෝන් ගිරුවාපත්තුවේ මුදලිධුරයට පත්වීම ද සැලකිය හැකි ය.[10] මේ අනුව මූලාශ්‍රගත කරුණුවලින් අනාවරණය වන්නේ යථෝක්ත කුලයන් සඳහා තත්කාලීන පිළිගැනීමට අනුව සමාජයේ උච්චස්ථානයට පත්වීම සඳහා මෙ මගින් පිටිවහලක් ලැබී ඇති බව යි.

මෙම පාරම්පරික ප්‍රභූ පැලැන්තිය, අනතුරු ව මෙරට බ්‍රිතාන්‍ය පාලනය යටතේ නව මධ්‍යම පංතියක් ලෙස ආරම්භ වන්නේ බ්‍රිතාන්‍යයන් යටතේ ක්‍රියාත්මක වූ වාණිජ ආර්ථිකයේ විපුල ඵල නෙළා ගනිමිනි. දහනව වන සියවසේ මධ්‍යම භාගයේ පමණ සිට මෙහි ආරම්භය සිදු වේ. මොවුන්ට සමාජයේ ඉහළ තත්ත්වයට පත්වීම සඳහා නියැළුණු ආර්ථික කටයුතු ක්ෂේත්‍ර දෙකකට අයත් වේ. එනම් වෙළඳ කටයුතු හා කර්මාන්ත එක් ක්ෂේත්‍රයක් ය. ඊට අමතර ව ඉඩම් ප්‍රයෝජනයට ගැනීම, වෙළඳභෝග වගාව සහ නාගරික දේපල හා සම්බන්ධ

ආයෝජනයන් ය. මෙබඳු කටයුතුවලින් බොහෝ පුද්ගලයින්ට හා පවුල්වලට විශාල ධනස්කන්ධයක් සපයා ගැනීමට මං පෑදුණේය. මෙම පවුල්වල සමරු ඡායාරූපයන් ඇසුරෙන් ද මැනවින් පෙනී යන පරිදි ඉතා සුඛෝපභෝගී වූත්, සුවිශේෂී දිවි පෙවෙතක් ගත කළ පිරිසක් බව පෙනේ.[11] බ්‍රිතාන්‍ය පාලනය යටතේ නව මධ්‍යම පංතියක් බිහිවීමට සුදුසු පරිසරයක් නිර්මාණය වීම සඳහා නව වැවිලි භෝග රැසක් හඳුන්වා දෙන ලදී. එම භෝග අතර දිවයිනේ පළමු වරට ඉතා ජනප්‍රියත්වයට පත්වූයේ කෝපි වගා ව්‍යාපාරය යි. කෝපි වැවීමේ ව්‍යාපාරයේ බොහෝ දුරට ව්‍යාප්තව පැවතුණේ පහතරට සිංහලයන් යටතේ ය.[12] මෙහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 1880 පමණ වනවිට මෙරට සිංහලයන් සතු වූ කෝපි වතු ප්‍රමාණය අක්කර 13500ක් පමණ වූ බව සංඛ්‍යා ලේඛනවලින් අනාවරණය වී ඇත.[13] පහතරට සිංහලයන් අතර කෝපි වැවීමෙන් ධනය උපයා ගත්තෙකු ලෙස ප්‍රමුඛස්ථානයට පත් ව ඇත්තේ සී. එම්. ද සොයිසා ය.[14] මීට අමතර ව හන්නඩිගේ ජෙරොනිස් පීරිස්, ඩබ්ලිව් හාර්මානිස් සොයිසා, ටී. බී. බ්‍රාස්, මීනා කැඩර් සහ සී. එම්. එච්. මරික්කාර් යන පුද්ගලයන් කෝපි වගා ව්‍යාපාරයට සෑහෙන තරම් දුරට සම්බන්ධ වී සිටියේ පහතරට දේශීය ප්‍රභූ පැලැන්තිය යි.[15]

පහතරට දේශීය ප්‍රභූවරු එවක බ්‍රිතාන්‍ය පාලනය යටතේ ධනය උපයා ගත් තවත් ආර්ථික භෝග වගාවක් වූයේ පොල් වගාවයි. පොල් වගාව කෙරෙහි ලාංකිකයන් වැඩියෙන් ම උනන්දුවක් දක්වන්නට පටන් ගත්තේ එක්දාස් අටසිය පනස් ගණන්වල මැද භාගයේ දී ය.[16] ඒ අනුව 1917 වර්ෂය වන විට අක්කර 100 කට වැඩි විශාල පොල්වතු සංඛ්‍යාවක් දේශීය වැවිලිකරුවන් සතුව පැවතුණි.[17] එම අවදියේ දී පොල් වගාවෙන් ධනය උපයාගෙන පහතරට පෙදෙසෙහි නායකත්වයට පත් වූ පිරිස් අතර ජේම්ස් ද අල්විස්, ද මෙල්, සී. එච්. ද. සොයිසා, වෛද්‍ය මාකස් ප්‍රනාන්දු, එස්. සී. ඔබයසේකර, ජෙරනෝනිස් පීරිස්, ටියුඩර් ද අබෲ, රාජපක්ෂ, තුඩුගලගේ දොන් පිලිප් විජේවර්ධන හා ප්‍රැන්සිස් පෙරේරා යන පුද්ගලයන් ප්‍රමුඛස්ථානයක් ගෙන ඇත.[18] එසේ ම ඩී. එස්. සේනානායකයන්ගේ පියා සතු ව අක්කර 2000 ක පමණ පොල්වතු තිබූ බවට සාක්ෂි ඇත.[19] එම පොල්වතු දියගම්පොළ, පහතතුඩාවේ, බෝතලේ සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිට්ටාව, ගල්නෙ, නොබොදාවදූර, නාගහම්පලාව, බෝයවලාන යන ප්‍රදේශයන්හි පිහිටා ඇත.[20] ඒ අනුව කොවුල්වැවේ පොල්වත්ත ඩී. එස්. සේනානායකයන් විසින් ම පොල්වගා කළ බව සඳහන් ය.[21] මින් පැහැදිලි වන්නේ ඩී. එස්. සේනානායක පරපුර